සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

# වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
# Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: I | කාලය / காலம் / Time: පැය 01 |

සැලකිය යුතුයි:

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(ii) අංක 01 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1 , 2 , 3 , 4 යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.

(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (×) ලකුණ යොදන්න.

---

(01) නූතන ප්‍රජාතන්ත්‍රවාදයේ නිජබිම ලෙස පිළිගනු ලබන්නේ,

(1) ජර්මනියයි. (2) ප්‍රංශයයි. (3) ග්‍රීසියයි. (4) බ්‍රිතාන්‍යයයි.

(02) ක්‍රි.ව. 1688 දී සිදුවූ උත්කෘෂ්ට විප්ලවය

(1) ප්‍රංශ විප්ලවයයි. (2) ඉංග්‍රීසි විප්ලවයයි.
(3) ඇමරිකන් විප්ලවයයි. (4) රුසියන් විප්ලවයයි.

(03) A - ජනතාවගේ බහුතර කැමැත්ත මත මහජන නියෝජිතයන් තෝරා පත් කරගනු ලබයි.

B - රටක ජනතාව එක් ස්ථානයකට රැස් වී ඉක්මනින් රාජ්‍ය පාලන කටයුතු පිළිබඳ සාකච්ඡා කර ජනතා කැමැත්ත මත තීරණ ගනු ලබයි.

C - ජනතාවගේ බහුතර කැමැත්ත මත තෝරා පත්කර ගනු ලබන නියෝජිතයන් මගින් පාලනය සිදු කරයි.

D - පුරවැසි සභාවේ දි පාලන කටයුතුවලට නගරවාසී කාන්තාවන්ට සහභාගී වීමට ඉඩ නොදෙයි.

ඉහත ප්‍රකාශයන්ගෙන් ඍජු ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ තොරතුරු හෙළි වන ප්‍රකාශයන් දෙක ඇතුළත් පිළිතුර කුමක් ද?

(1) B හා D ය. (2) A හා D ය. (3) C හා B ය. (4) D හා C ය.

(04) පහත නිර්වචනයන්ගෙන් ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ සීලර්ගේ නිර්වචනය කුමක් ද?

A - සියලු නීත්‍යානුකූල රාජ්‍ය පාලන රදා පවත්නේ පාලනය කරනු ලබන ජනතාවගේ කැමැත්ත මත ය.

B - නිදහස්ව උපන් මිනිසා නිදහසේ ජීවත් විය යුතු ය.

C - ජනතාව විසින් ජනතාව උදෙසා පවත්වාගෙන යනු ලබන ජනතාවගේ පාලන ක්‍රමය ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයයි.

D - ප්‍රජාතන්ත්‍රවාදය යනු සියලු දෙනාට ම අයිතිවාසිකම් හිමිවන පාලන ක්‍රමයයි.

(1) A ය. (2) B ය. (3) C ය. (4) D ය.

(05) නූතන රාජ්‍ය තුළින් පක්ෂ ක්‍රමයේ විවිධ ස්වරූප හඳුනාගත හැකි ය. පහත දැක්වෙන වරණවලින් ද්වි පක්ෂ ක්‍රමයක් හා ඒක පක්ෂ ක්‍රමයක් ක්‍රියාත්මක රටවල් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ඉන්දියාව හා ඇමරිකා එක්සත් ජනපදය. (2) ලංකාව හා කියුබාව.
(3) මහා බ්‍රිතාන්‍ය හා චීනය. (4) කොරියාව හා මහා බ්‍රිතාන්‍ය.

(06) ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ඡන්ද කොට්ඨාස බෙදා වෙන් කිරීම සඳහා යොදාගන්නා ප්‍රධාන නිර්ණායක වන්නේ,

(1) ජන වර්ගය හා ආගමයි. (2) භූමිය හා ජනගහනයයි.
(3) භාෂාව හා කුලයයි. (4) දිස්ත්‍රික්ක හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයයි.

(07) පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක ලක්ෂණයක් පමණක් ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) විධායකය, ව්‍යවස්ථාදායකයට වගකීමට ඍජුව බැඳී නැත.
(2) ව්‍යවස්ථාදායකය මගින් ඍජුව විධායකය පාලනය කිරීමක් සිදු නොවේ.
(3) විධායක බලය හසුරුවනු ලබන්නේ ජනාධිපතිවරයා විසින් ය.
(4) ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත්වේ.

(08) "බාහිර බාධකයන්ගෙන් තොරව පුද්ගලයාට සිය පෞද්ගලිකත්වය වර්ධනය කර ගැනීමට ඇති ඉඩ ප්‍රස්ථාව නිදහසයි." යනුවෙන් නිදහස පිළිබඳ නිර්වචනය කරනු ලැබුවේ,

(1) ජී.ඩී.එච්.කෝල් ය. (2) ටී. බී. ටයිලර් ය.
(3) ඒබ්‍රහම් ලින්කන් ය. (4) චාර්ල්ස් ඒ. එල්වුඩ් ය.

(09) ක්‍රි.ව. 1948 දෙසැම්බර් 10 වන දින එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලය විසින් සම්මත කරන ලද ප්‍රකාශනය

(1) ළමා අයිතිවාසිකම් පිළිබඳ ප්‍රකාශනයයි.
(2) මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනයයි.
(3) සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර් ජාතික සම්මුතියයි.
(4) මිනිස් හා පුරවැසියන් පිළිබඳ ප්‍රංශ ප්‍රකාශනයයි.

(10) රටක උත්තරීතර ලේඛනය මෙන්ම මූලික නීතිය වන්නේ,

(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවයි. (2) මානව හිමිකම් ප්‍රඥප්තියයි.
(3) දණ්ඩ නීති සංග්‍රහයයි. (4) එක්සත් ජාතීන්ගේ මණ්ඩලයේ ප්‍රඥප්තියයි.

(11) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනය හා 1987 අංක 42 දරණ පාර්ලිමේන්තු පනත මගින් ඇති කළ පාලන ආයතනය වන්නේ,

(1) මහනගර සභා ය. (2) නගර සභා ය.
(3) පළාත් සභා ය. (4) ප්‍රාදේශීය සභා ය.

(12) රටක යුක්තිය පසිඳලීමේ ක්‍රියාදාමය ඉටු කරනු ලබන්නේ,

(1) ව්‍යවස්ථාදායකයයි. (2) විධායකයයි.
(3) පළාත් ආණ්ඩුවයි. (4) අධිකරණයයි.

(13) තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වන පාලන ක්‍රම සහිත රාජ්‍ය හඳුන්වනු ලබන්නේ,

(1) සන්ධීය රාජ්‍යයන් ලෙස ය. (2) ඒකීය රාජ්‍යයන් ලෙස ය.
(3) රාජාණ්ඩු ලෙස ය. (4) රදල ආණ්ඩු ලෙස ය.

(14) ආණ්ඩුවක ප්‍රධාන අංග සඳහන් පිළිතුර තෝරන්න.
(1) ව්‍යවස්ථාදායකය, ප්‍රාදේශීය සභා, ප්‍රාන්ත ආණ්ඩු.
(2) ව්‍යවස්ථාදායකය, විධායකය, අධිකරණය.
(3) ව්‍යවස්ථාදායකය, පළාත් පාලන ආයතන, විධායකය.
(4) විධායකය, ප්‍රාන්ත ආණ්ඩු, ශ්‍රේෂ්ඨාධිකරණය.

(15) රාජ්‍යයන් තුළ දක්නට ලැබෙන ප්‍රධාන ලක්ෂණ හතරකි.
(1) භූමිය, අධිකරණය, ජනගහනය, ස්වාධිපත්‍යය.
(2) ජනගහනය, පළාත් පාලනය, භූමිය, සමාජ සංවිධාන.
(3) ආණ්ඩුව, ප්‍රාදේශිය සභා, භූමිය, ස්වාධිපති බලය.
(4) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය.

(16) තම ඡන්ද බලය යොදවා සුදුසු පාලකයන් පත්කර ගැනීමටත්, නුසුදුසු පාලකයන් ඉවත් කර ගැනීමටත් ජනතාවට ඇති අයිතිය 1978 ශ්‍රී ලංකා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සඳහන් වනුයේ,
(1) පුරවැසි අයිතිවාසිකම් සුරැකීම ලෙස ය.
(2) මහජන අපේක්ෂා ඉටුවීමක් ලෙස ය.
(3) ජනතා පරමාධිපත්‍ය ලෙස ය.
(4) නීතියේ සාධාරණත්වය සුරක්ෂිත කිරීමක් ලෙස ය.

(17) A - පාලනයේ ක්‍රමවත් බව හා ස්ථාවර බව ආරක්ෂා වීම.
B - පවත්නා නීතිය යටතේ වරදකරුවන්ට දඬුවම් පැමිණවීම.
C - ජනතාවගේ නීතිය පිළිබඳ දැනුම වර්ධනය වීම.
D - චෝදනා පත්‍රයකට අනුව පමණක් පුද්ගලයකු අත්අඩංගුවට ගැනීම.
නීතියේ ආධිපත්‍ය පවතින බව විදහාපාන ලක්ෂණ ඇතුළත් අක්ෂර යුගලය වනුයේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) B හා D ය. (4) D හා A ය.

(18) ප්‍රජාතන්ත්‍රවාදි රටක පුරවැසියකු සතු විය යුතු වැදගත් ගුණාංගයක් ඇතුළත් පිළිතුර තෝරන්න.
(1) බහුතර මතයට ගරු කිරීම. (2) අයිතිවාසිකම් පමණක් භුක්ති විඳීම.
(3) විරුද්ධ මත පිළිබඳ නොසැලකීම. (4) තීරණ ගැනීමේ දී ඒකමතික තීරණ ගැනීම.

(19) ශ්‍රී ලංකාවේ ජනාධිපති ආණ්ඩු ක්‍රමය ක්‍රියාත්මක වන්නේ,
(1) වර්ෂ 1972 න් පසුව ය. (2) වර්ෂ 1978 න් පසුව ය.
(3) වර්ෂ 1977න් පසුව ය. (3) වර්ෂ 1980න් පසුව ය.

(20) ශ්‍රී ලංකාවේ පළාත් ආණ්ඩුකාරවරයාගේ නිල කාලය
(1) අවුරුදු පහකි. (2) අවුරුදු තුනකි.
(3) අවුරුදු හතරකි. (4) අවුරුදු හයකි.

(21) පුරවැසි යුතුකම් පිළිබඳ අවබෝධයක් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ
(1) 26 වන ව්‍යවස්ථාවේ සඳහන් ය. (2) 27 වන ව්‍යවස්ථාවේ සඳහන් ය.
(3) 28 වන ව්‍යවස්ථාවේ සඳහන් ය. (4) 30 වන ව්‍යවස්ථාවේ සඳහන් ය.

(22) A - නීතිගරුක වීම.
B - අන් අයගේ නිදහස අගය කිරීම.
C - පාලන කටයුතු පිළිබඳ අවබෝධයෙන් සිටීම.
D - අන් අයට ගරු කිරීම.
ඉහත සඳහන් ප්‍රකාශවලින් පුරවැසියකුගේ වගකීම පෙන්නුම් කරන ප්‍රකාශය ඇතුළත් අක්ෂර කාණ්ඩය වනුයේ,
(1) A. B, D (2) A. B, C (3) B, C, A (4) B, C, D

(23) රජයක් විසින් බලය විමධ්‍යගත කිරීම විවිධාකාරයෙන් සිදු කරනු ලැබේ. ඒ අනුව "අ" යටතේ දක්වා ඇති පරිපාලන කොට්ඨාස "ආ" යටතේ දක්වා ඇති පරිපාලන තනතුරු සමඟ ගැළපූ විට ලැබෙන පිළිතුර කුමක් ද?

| "අ" | "ආ" |
|---|---|
| 1. ග්‍රාම නිලධාරී කොට්ඨාස මට්ටම | A. දිස්ත්‍රික් ලේකම් |
| 2. ප්‍රාදේශීය මට්ටම | B. අමාත්‍යාංශ ලේකම් |
| 3. දිස්ත්‍රික්ක මට්ටම | C. ප්‍රාදේශීය ලේකම් |
| 4. ජාතික මට්ටම | D. ග්‍රාම නිලධාරී |
| | E. පළාත් ආණ්ඩුකාර |

(1) A. B, C, D (2) D, C, A, B (3) B, A, D, C (4) A, C, B, D

(24) කැන්ටන් නමින් හැඳින්වෙන ප්‍රාන්ත ආණ්ඩු 26ක් හිමි සන්ධීය රාජ්‍යය වනුයේ,
(1) ඇමරිකා එක්සත් ජනපදය. (2) ඕස්ට්‍රේලියාව.
(3) ඉන්දියාව. (4) ස්විට්සර්ලන්තය.

(25) ඒකීය ආණ්ඩුක්‍රමයක් පවතින රාජ්‍යයකට උදාහරණයකි.
(1) සෝමාලියාව (2) ප්‍රංශය (3) මහා බ්‍රිතාන්‍ය (4) ජර්මනිය

(26) ෆෙඩරල් අධිකරණ පද්ධතියක් හිමි ව්‍යවස්ථාදායකය වන කොන්ග්‍රස් මණ්ඩලය නියෝජිත මන්ත්‍රී මණ්ඩලය හා සෙනට් සභාව යන ආයතන දෙකක් ක්‍රියාත්මක වන ආණ්ඩුක්‍රම ව්‍යුහයක් සහිත සන්ධීය රාජ්‍ය වනුයේ,
(1) ශ්‍රී ලංකාවයි. (2) ඉතාලියයි
(3) කෙන්යාවයි. (4) ඇමරිකා එක්සත් ජනපදයයි.

(27) බ්‍රිතාන්‍ය පාලන යුගය තුළ ශ්‍රී ලංකාවේ බලය විමධ්‍යගත කිරීමට ගත් පියවරකි මහා නගර සභා ස්ථාපිත කිරීම. ඒ සඳහා පදනම් කරගත් නගර දෙක වනුයේ,
(1) කොළඹ හා මහනුවර (2) ගාල්ල හා මාතර
(3) නුවර සහ යාපනය (4) නුවර සහ කළුතර

(28) සෑම පළාත් සභාවකම ජනාධිපතිතුමා විසින් නම් කර පත් කරන ධූරය කුමක් ද?
(1) ප්‍රධාන ඇමති ධූරය. (2) ආණ්ඩුකාර ධූරය.
(3) අමාත්‍ය ධූරය. (4) මන්ත්‍රී ධූරය.

(29) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන ව්‍යවස්ථා සංශෝධනයට අනුව පළාත් සභා සතු බලතල ලැයිස්තු
(1) දෙකක් යටතේ වර්ග කර ඇත. (2) තුනක් යටතේ වර්ග කර ඇත.
(3) හතරක් යටතේ වර්ග කර ඇත. (4) පහක් යටතේ වර්ග කර ඇත.

(30) A - විදේශ කටයුතු

B - සැලසුම් කිරීම

C - ආගමනය හා විගමනය සහ පුරවැසිභාවය

D - සමාජ සේවා හා පුනරුත්ථාපන

ඉහතින් සඳහන් වනුයේ 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව පළාත් සභා සතු බලතල හා කාර්යයන් කිහිපයකි. ඉන් සංවෘත ලැයිස්තුවට අයත් බලතල දක්වා ඇත්තේ

(1) A සහ B මගින් ය. (2) B සහ D මගින් ය.

(3) A සහ C මගින් ය. (4) A සහ D මගින් ය.

(31) ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුවේ වර්ෂ 2012 ජන සංගණන වාර්තාවට අනුව ශ්‍රී ලංකාවේ දෙමළ ජන සංඛ්‍යාවේ ප්‍රතිශතය වනුයේ,

(1) 9.2% කි. (2) 0.5% කි. (3) 74.9%කි. (4) 11.2%කි.

(32) "වෙනස්කම් තුළින් එකමුතු බව යන්න" තේමාව කරගෙන ආර්ථික සමාජීය හා දේශපාලන ක්‍රියාවලියේ දි බහු සංස්කෘතිකභාවය හොඳින් ප්‍රයෝජනයට ගත් රටකට උදාහරණයකි.

(1) සිංගප්පූරුව. (2) ඉන්දියාව. (3) කැනඩාව. (4) බ්‍රසීලය.

(33) භූමිය සහ ප්‍රාග්ධනය යන නිෂ්පාදන සාධකවලට කරන ගෙවීම් නිවැරදිව දක්වා ඇති වරණය තෝරන්න.

(1) බදු කුළිය සහ වැටුප් (2) බදුකුලිය සහ පොළී

(3) බදුකුළිය සහ ලාභ (4) වැටුප හා ලාභ

(34) අන්තර් භාණ්ඩයකට උදාහරණයකි.

(1) ඇඳුම්. (2) යන්ත්‍ර සූත්‍ර.

(3) ගෘහ භාණ්ඩ නිෂ්පාදනය සඳහා භාවිත කරන දැව. (4) වාහන.

(35) ධනවාදී අර්ථ ක්‍රමය පවතින රටකි.

(1) උතුරු කොරියාව (2) ඔස්ට්‍රේලියාව

(2) යුක්රේනය (4) ශ්‍රී ලංකාව

(36) පරිවර්තන ආර්ථික ක්‍රමයක් කරා යොමුව සිටින රටකට නිදසුනකි.

(1) දකුණු කොරියාව (2) කියුබාව

(3) ඕස්ට්‍රේලියාව (4) රුසියාව

(37) විවෘත ආර්ථික ප්‍රතිපත්ති මත ක්‍රියාත්මක වන වෙළෙඳපොල අර්ථක්‍රමයක් ශ්‍රී ලංකාවට හඳුන්වා දුන්නේ,

(1) වර්ෂ 1974 දී ය. (2) වර්ෂ 1977 දී ය.

(3) වර්ෂ 1978 දී ය. (4) වර්ෂ 1981 දී ය.

(38) සංවර්ධනය කරා යන ගමනේ දි ආර්ථිකය සතු සම්පත් අනාගත පරම්පරාව සඳහා සුරක්ෂිත කරමින් වර්තමාන අවශ්‍යතා ඉටුකර ගැනීම හඳුන්වන්නේ,

(1) සදාචාර සංවර්ධනය ලෙස ය. (2) සමාජ සංවර්ධනය ලෙස ය.

(3) තිරසාර සංවර්ධනය ලෙස ය. (4) සංස්කෘතික සංවර්ධනය ලෙස ය.

(39) ශ්‍රී ලංකාවේ සංවර්ධනය පිළිබඳ දර්ශක අනුව වර්ෂ 2012 දී සාක්ෂරතාව

(1) 92% කි. (2) 91%කි. (3) 90%කි. (4) 90.5%කි.

(40) ගැටුම් පිළිබඳ අධ්‍යයනය සඳහා යොදාගනු ලබන ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය ලොවට හඳුන්වා දුන්නේ,

(1) ජොහාන් කැල්වින් ය. (2) ජොහාන් ස්මිත් ය.

(3) ජොහාන් කැපර් ය. (4) ජොහාන් ගැල්ටුන් ය.

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2017
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 10 | විෂයය / பாடம் / Subject: පුරවැසි අධ්‍යාපනය | පත්‍රය / வினாத்தாள் / Paper: II | කාලය / காலம் / Time: පැය 02 |

සැලකිය යුතුයි:

- පළමුවන ප්‍රශ්නය අනිවාර්ය වේ.
- පළමුවන ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

---

(01) (i) ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක දැකිය හැකි ප්‍රධාන ස්වරූප දෙක නම් කරන්න.

(ii) සමාජ හා ජීවන ක්‍රමයක් ලෙස ද ප්‍රජාතන්ත්‍රවාදය වැදගත් වේ. මෙම ප්‍රකාශය සනාථ කළ හැකි කරුණු දෙකක් දක්වන්න.

(iii) තරඟකාරී පක්ෂ ක්‍රමයක් පැවැතීම නිසා සිදුවන වාසි දෙකක් ලියන්න.

(iv) බස්නාහිර පළාතට අයත් දිස්ත්‍රික්ක දෙකක් නම් කරන්න.

(v) සන්ධීය රාජ්‍යයක මූලික ලක්ෂණ දෙකක් ලියන්න.

(vi) බලය විවිධ ස්වරූපයෙන් පවතී. එහි ස්වරූප දෙක දක්වන්න.

(vii) අධිකරණය සතු බලතල හා කාර්යයන් දෙකක් ලියන්න.

(viii) පරිවර්තන ආර්ථිකයන්හි ලක්ෂණ දෙකක් ලියන්න.

(ix) සංස්කෘතිය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ සමාජ විද්‍යාඥයින් දෙදෙනෙකු නම් කරන්න.

(x) මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමු විය හැකි අංශ දෙකක් දක්වන්න.

(ලකුණු 02 x 10 = 20)

(02) (i) යුරෝපයේ බිහිවූ ප්‍රථම ජාතික රාජ්‍යයන් දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ජාතික රාජ්‍ය බිහිවීමට බලපෑ හේතු තුනක් ලියන්න. (ලකුණු 03)

(iii) ජාතික රාජ්‍ය පිළිබඳ සංකල්පය ප්‍රබල තත්ත්වයට ගෙනඒමට අදහස් දැක්වූ දේශපාලන චින්තකයන් දෙදෙනෙකු නම් කර ඊට බලපෑ හේතු නිදසුන් දක්වමින් විස්තර කරන්න. (ලකුණු 05)

(03) (i) පළාත් සභා සතු බලතල හා කාර්යයන් ඇතුළත් 1 වැනි ලැයිස්තුව හඳුන්වන නම හා ඊට අයත් බලතල හා කාර්ය ගණන ලියන්න. (ලකුණු 02)

(ii) (a) මධ්‍යම ආණ්ඩුව සහ පළාත් සභා යන දෙවර්ගයට ම සමසේ භුක්තිවිඳිය හැකි බලතල දක්වා ඇති ලැයිස්තුව හඳුන්වන නම හා කාර්ය ගණන ලියන්න.

(b) මෙම ලැයිස්තුවට අයත් බලතලයක් වන කෘෂිකර්මය හා ගොවිජන සේවා යන්නට අයත් කරුණු එකක් දක්වන්න. (ලකුණු 03)

(iii) එම ලැයිස්තුවට අයත් සමාජ සේවා සහ පුනරුත්ථාපන යන බලතල සම්බන්ධව විස්තර කරන්න. (ලකුණු 05)

(04) (i) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) බහු සංස්කෘතික ජන සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් සිදු විය හැකි යහපත් ප්‍රතිඵල තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) බහු සංස්කෘතික ජන සමාජයේ සාමාජිකයන් ලෙස එක්සත්ව ජීවත්වීමේ ජාතික වැදගත්කම කරුණු දෙකක් ඇසුරෙන් විස්තර කරන්න. (ලකුණු 05)

(05) (i) ඕනෑම අර්ථක්‍රමයකට මුහුණ දීමට සිදුවන මූලික ආර්ථික ප්‍රශ්න කොටස් තුනකට බෙදිය හැකි ය. ඉන් දෙකක් සඳහන් කරන්න (ලකුණු 02)

(ii) ආර්ථිකයක සිදුවන විවිධ ක්‍රියාවලි ප්‍රධාන කොටස් තුනකට බෙදිය හැකිය. එම කොටස් තුන ලියන්න. (ලකුණු 03)

(iii) ශ්‍රී ලංකා ආර්ථිකය තුළ දැකිය හැකි මිශ්‍ර ආර්ථික ලක්ෂණ තුනක් ලියා ඉන් එකක් විස්තර කරන්න. (ලකුණු 05)

(06) (i) ගෝලීයකරණය තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් නම් කරන්න. (ලකුණු 02)

(ii) ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ලැබෙන ලක්ෂණ තුනක් දක්වන්න. (ලකුණු 03)

(iii) ගෝලීයකරණයට මුහුණ දීමට ලොව විවිධ රටවල් එකතු වී සංවිධාන බිහිකර ගෙන ඇත. තෝරා ගත් සංවිධාන දෙකක අරමුණු පැහැදිලි කරමින් විස්තර කරන්න. (ලකුණු 05)

(07) (i) ගැටුම් වර්ග පුළුල් ලෙස ප්‍රධාන කේෂ්ත්‍ර දෙකක් ඇසුරෙන් අධ්‍යයනය කළ හැකි ය. එම කෂේත්‍ර දෙක නම් කරන්න. (ලකුණු 02)

(ii) ගැටුම් ඇති වන මූල හතරෙන් තුනක් සඳහන් කරන්න. (ලකුණු 03)

(iii) ගැටුම් නිරාකරණය කිරීමේ ක්‍රමයක් ලෙස සාකච්ජා ක්‍රමයේ ගති ලක්ෂණ දෙකක් ලියා විස්තර කරන්න. (ලකුණු 05)